# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 12/2016**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 අගෝස්තු මස 18වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>රාජකාරී ඉටු කරමින් සිටියදී තුවාළ ලබන විශ්වවිද්‍යාල සේවකයන් සඳහා වන්දි</u>**

1999.06.10 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747, 2013.09.13 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 13/2013 මගින් අනුගත කර ගත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/93 හා 2015.10.06 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 13/2013 (i) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2016.07.07 දින පැවති සිය 944වන සභා වාරයේ දී, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/93 හි 3 (අ) (i) වගන්තිය විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයන් සඳහා උපයෝගී කර ගත නොහැකි ය යන කරුණ සළකා බැලූ කොමිෂන් සභාව, රාජකාරී ඉටු කරමින් සිටියදී තුවාළ ලබන සේවකයන් සඳහා (ආයතන චක්‍රලේඛ ලිපි අංක 13/2013 මගින් අනුගත කර ගන්නා ලද) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/93 හි අනෙකුත් විධිවිධාන ප්‍රකාරව වන්දි ගෙවීම සඳහා වූ අධිකාරී බලය, විශ්වවිද්‍යාලවල අදාළ පාලක සභා මගින් පත් කරන ලද වෛද්‍ය මණ්ඩලයන්හි නිර්දේශ මත විශ්වවිද්‍යාල පාලක සභාවලට ලබා දීමට තීරණය කරන ලදී.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අ/කළෝ: මහාචාර්ය මොහාන් ද සිල්වා**

**සභාපති**

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. ප්‍රධාන අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය : යූජීසී/එච්ආර්/6/2/49